# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 52 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

(1973 දෙසැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 52 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 42/73

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය සහ අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 52 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය සහ අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනතේ 9 වන වගන්තියෙහි (6) වන උපවගන්තියේ '"දායක මුදල් ගෙවිය යුතු ආදායම" යනුවෙන් සඳහන් කරනු ලැබේ.' යන වචන වෙනුවට පහත සඳහන් වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **1972 අංක 15 දරන පනතේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.**

'"දායක මුදල් ගෙවිය යුතු ආදායම" යනුවෙන් සඳහන් කරනු ලැබේ :

එසේ වුව ද, 1973 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන සහ 1973 ජූනි මස 30 වන දිනයෙන් අවසන් වන කාලය ඇතුළත යම් අවස්ථාවක දී යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රධාන පනතේ 16ඇඇ වන වගන්තියේ අර්ථානුකූල වූ පිළිගත් ආයෝජනයක් සම්බන්ධයෙන්, 1973 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය වෙනුවෙන්, (ආ) ඡේදය යටතේ කරන ලද යම් නියමයක් යටතේ ඒ තැනැත්තාට අඩු කිරීමට හිමිකම් ඇති යම් දීමනාවක් ඔහු විසින් අඩු කරනු ලැබී නම්, ඒ ආයෝජනය සම්බන්ධයෙන් 1974 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා (අ) ඡේදය යටතේ යම් අඩු කිරීමක් සඳහා ඒ තැනැත්තා හිමිකම් නො ලබන්නේ ය.'.

2—ඒ 01642—10,382 (73/10)